# රජයේ විකිරණ විද්‍යා තාක්ෂණවේදීන්ගේ සංගමය
# GOVT. RADIOLOGICAL TECHNOLOGISTS' ASSOCIATION
# அரச கதிரியல் தொழில்நுட்பவியலாளர் சங்கம்

*Trade Union No: 814, Founded On 4th July 1948*

OFFICE ADDRESS : 247, MADIWELA ROAD, UDAHAMULLA, NUGEGODA.
TEL : GEN. SECRETARY - 071 4426998 PRESIDENT - 071 8658620


මගේ අංකය : 19/TUA/25-26

**කඩිනම් අවධානය පිණිසයි.**

2026.01.12

විශේෂඥ වෛද්‍ය. අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

සෞඛ්‍ය ලේකම්තුමනි,

## විනය විරෝධී සහ විෂමචාරී ලෙස කටයුතු කරන මාලිගාවත්ත රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට (රා. ආ.) එරෙහිව ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් සිදුකරන වෘත්තීය ක්‍රියාමාර්ගය.

**සංගමයේ අංක 16/TUA/25-26 හා 2026.01.06 දිනැති ලිපිය හා බැඳේ. (ලිපිය අමුණා ඇත.)**

මාලිගාවත්ත වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ ජාතික මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය සිදුකරන චාල්ස් නුගවෙල මහතා දිගින් දිගටම සිදුකරන විනය විරෝධී සහ විෂමාචාරී ක්‍රියාවන් සම්බන්ධයෙන් දැනුම් දුන්නද මේ වනතෙක් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාකර නොමැත.

එමනිසා **2026 ජනවාරි 21 වෙනිදා උදේ 8.00 සිට දිවයින පුරා රෝහල්හි එක් දින වැඩ වර්ජනයක්** ක්‍රියාත්මක කිරීමට විධායක සභාව තීරණය කර ඇති බව දන්වමි

මෙලෙස දිගින් දිගටම ඔහුට විරුද්ධව ක්‍රියා නොකර එම පුද්ගලයාව ආරක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කිරීම දැඩි කණගාටුවට කරුණක් වන අතර එමගින් තවදුරටත් ඔහුට එලෙස රාජ්‍ය සේවය අපහසුතාවයට පත්කරන විෂමාචාර හැසිරීමට උනන්දු කරවන්නක් බව කිව යුතුය.

එම නිසා පහත කරුණු පිළිබඳව ඔබතුමාගේ කඩිනම් අවධානය යොමු කරන ලෙස ඉල්ලමි.

1. **විෂමාචාරී සිද්ධීන්වලට අදාළ ලිඛිත සාක්ෂි ආරක්ෂා කිරීමට කඩිනමින් උපදෙස් දීම.**
2. **සිදුවීම් වලට අදාළ CCTV දර්ශන ආරක්ෂා කිරීමට උපදෙස් ලබාදීම.**
3. **සිද්ධීන් පිළිබඳව සාක්ෂි දරණ පුද්ගලයන්ට සිදුකරන බලපෑම් ඉවත් කිරීම සහ ඔවුන්ට ආරක්ෂාව ලබාදීම.**

ඉහත කී නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වහාම එම තනතුරු වලින් සහ රෝහලෙන් ඉවත් කොට විධිමත් පරීක්ෂණයක් කඩිනමින් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටී. එමෙන්ම මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කඩිනමින් අවස්ථාවක් ලබා දෙන ලෙසද ඉල්ලා සිටිමි.

**තවදුරටත් මේ පිළිබඳව කටයුතු නොකරන්නේ නම් වර්ජන ක්‍රියාමාර්ගය තීව්‍ර කිරීමට සිදුවන බව කණගාටුවෙන් වුවද දන්වමි.**

ස්තුතියි !
මෙයට - විශ්වාසී,

චානක ධර්මවික්‍රම
සභාපති

CHANAKA DHARMAWICKRAMA
President
Gov. Radiological Technologists' Association
hwchanaka@gmail.com

පිටපත් -: 1. වෛද්‍ය නලින්ද ජයතිස්ස - ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
2. අතිරේක ලේකම් (පාලන 1)
3. අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)
4. අතිරේක ලේකම් (පාලන 2)
5. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
6. නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (විමර්ශන)
7. නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (පාලන 3)

# රජයේ විකිරණ විද්‍යා තාක්ෂණවේදීන්ගේ සංගමය
# GOVT. RADIOLOGICAL TECHNOLOGISTS' ASSOCIATION
# அரச கதிரியல் தொழில்நுட்பவியலாளர் சங்கம்

*Trade Union No: 814, Founded On 4th July 1948*

OFFICE ADDRESS : 247, MADIWELA ROAD, UDAHAMULLA, NUGEGODA.
TEL : GEN. SECRETARY - 071 4426998 PRESIDENT - 071 8658620


මගේ අංකය : 16/TUA/25-26

06.01.2026

වෛද්‍ය නලින්ද ජයතිස්ස,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
පූජ්‍ය බද්දේගම විමලවංස හිමි මාවත,
කොළඹ 10.

සෞඛ්‍ය අමාත්‍යතුමනි,

## සුදුසුකම් නොලත් පුද්ගලයන් රජයේ රෝහලක් තුළ සේවයේ යෙදවීම සහ රෝගීන් විකිරණයට භාජනය කිරීමට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට බලකිරීම

**ආසන්නතම සිදුවීම :-**

**"මාලිගාවත්ත වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ ජාතික මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ලෙස රාජකාරී ආවරණය කරන චාල්ස් නුගවෙල මහතා විසින් 2026 ජනවාරි 04 වන දින සවස එම රෝහලේ රෝගියෙකුගේ විකිරණ පරීක්ෂණ සිදු කිරීම සඳහා එම රෝහල් කාර්ය මණ්ඩලයේ නොවන සුදුසුකම් නොලත් පුද්ගලයකු යෙදවීම."**

නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස රාජකාරිය ආවරණයේ නිරත චාල්ස් නුගවෙල මහතා විසින් ඉහත සඳහන් දිනයට අමතරව **2024.06.04** දින සහ ඊට ඉහත අවස්ථා කිහිපයකදීම තම පුද්ගලික හිතවත්කම් මත සුදුසුකම් නොලත් පුද්ගලයන් රෝහලට ගෙන්වා රෝගීන්ව විකිරණයට ලක් කොට විකිරණ පරීක්ෂණ සිදු කරවා නීති විරෝධී ක්‍රියාවන්හි නිරතව ඇත.(ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයට පැමිණිලි කර ඇතත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත).එමෙන්ම රෝගීන් පුද්ගලික රෝහල් වෙත ගිලන් රථ මගින් ප්‍රවාහනය කොට රෝහල මගින් මුදල් ගෙවා විකිරණ පරීක්ෂණ සිදු කිරීමට කටයුතු කර ඇත.

මෙලෙස රාජකාරී ආවරණයේ නිරත නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා,

1. **සුදුසුකම් නොලත් පුද්ගලයකුට රජයේ රෝහලක නේවාසික රෝගීන් විකිරණයට භාජනය කොට විකිරණ පරීක්ෂණ සිදු කිරීමට ඉඩ ලබාදීම.**
2. **අනුමැතිය නොලත් ( විධිමත් පත්වීමක් නොලත්) පුද්ගලයෙකුට රජය සතු උපකරණ සහ ශල්‍ය ද්‍රව්‍ය භාවිතා කිරීමට ඉඩ සැලසීම.**
3. **සූක්ෂම විකිරණ යන්ත්‍ර අවසර නොලත් පුද්ගලයන්ට භාවිතා කිරීමට ඉඩ ලබාදීම මගින් එම යන්ත්‍ර අනතුරට ලක් කිරීමට උත්සාහ කිරීම.**
4. **රජයේ ගිලන් රථ මගින් අනවසර පුද්ගලයන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීම.**
5. **විකිරණ ආරක්ෂණ පනත උල්ලංඝනය කිරීම. (බලය නොලත් පුද්ගලයින්ට යන්ත්‍ර හැසිරවීමට ඉඩ හැරීම)**
6. **විකිරණ ජායා පටල අපතේ යැවීමට ඉඩහැරීම.**

**7. විකිරණ පරීක්ෂණ පුද්ගලික රෝහල්වලින් සිදු කිරීමට රාජ්‍ය මුදල් වැය කිරීම.**

**8. රෝගීන් රෝහලෙන් පිටතට ප්‍රවාහනය කරමින් අනතුරු දායක තත්ත්වයකට පත් කිරීම.**

යන වරදවල් සහ නීති විරෝධී විෂමාචාරී ක්‍රියාවන්හි නිරත වී ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් විකිරණ තාක්ෂණවේදී නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබියදී ඔවුන්ගේ සේවාව ලබාගැනීමට අවශ්‍ය ඇමතුම් සේවා ඉටුකිරීමට අදාළව ප්‍රවාහන පහසුකම් සහ ගෙවීම් පහසුකම් ලබා නොදී මේ ආකාරයේ විනය සහ නීති විරෝධී විෂමාචාරී හැසිරීම පිළිබඳව කඩිනම් විනය පරීක්ෂණයක් අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට එරෙහිව සිදු කරන මෙන් ඉල්ලා සිටිමි.

මීට ඉහතදී මේ පිළිබඳව සිදුකළ පැමිණිලිවලට අදාළව සෞඛ්‍ය ලේකම්වරයා හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු නොකිරීම පිළිබඳව දැඩි අප්‍රසාදය පළ කරන අතරම **මේ පිළිබඳව කඩිනම් ප්‍රතිචාර නොදක්වන්නේ නම් 2026 ජනවාරි 12 වෙනිදාට පසුව ශ්‍රී ලංකා ජාතික රෝහල සහ අදාළ රෝහල වර්ජන ක්‍රියාමාර්ගයකට අවතීර්ණය වීමට තීරණය කර ඇති බවද දන්වමි.**

ස්තූතියි !
මෙයට - විශ්වාසී,



CHANAKA DHARMAWICKRAMA
President
Gov. Radiological Technologists' Association
hwchanaka@gmail.com

චානක ධර්මවික්‍රම
සභාපති

පිටපත් -: 1. අතිගරු ජනාධිපතිතුමා
2. සභාපති - අල්ලස් හෝ වංචා දූෂණ විමර්ශන කොමිසම
3. සෞඛ්‍ය ලේකම්තුමා
4. අතිරේක ලේකම් (පාලන 1)
5. අතිරේක ලේකම් (පාලන 2)
6. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
7. අධ්‍යක්ෂක ජනරාල් - ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
8. නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (විමර්ශන)
9. නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (පාලන 3)
10. සමස්ත සාමාජිකත්වය.